# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

India's National Spiritual Newspaper

₹ 10/-

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XIX | YEAR OF OUR LORD JESUS CHRIST, 2025 MARCH | Issue No. 04


## ශුද්ධවූ බයිබලය

### (ගීතාවලිය 19:1-9)

01. අහස දෙවියන්වහන්සේගේ මහිමය ප්‍රකාශකරයි; ගුවන්තලය උන්වහන්සේගේ හස්ත කර්මාන්තය දක්වයි.

02. දවාල දවාලට කථාකරයි, රාත්‍රිය රාත්‍රියට ඥානය දක්වයි.

03. කථාවක්වත් වචනයක්වත් නැත; ඒවායේ ශබ්දය නොඇසෙයි.

04. ඒවායේ මායිම පොළොව මුළුල්ලේද ඒවායේ වචන ලෝකයේ කෙළවර දක්වාද පැතිරගියේය. එහි උන්වහන්සේ සූර්යයාට මණ්ඩපයක් පිහිටෙවුසේක.

05. ඔහු තමාගේ භවනයෙන් නික්මෙන මනමාලයෙකු වැනිය, තමාගේ ගමන දුවන්ට ශක්තිමත් කෙනෙකුමෙන් ප්‍රීතිවෙයි.

06. ඔහුගේ නික්මයාම අහසේ කෙළවරෙන් වේ, වටේට යාමත් එහි කෙළවර දක්වාවේ. ඒකේ රස්නය නොවැදෙන කිසිවක් නැත්තේය.

07. ස්වාමීන්ගේ ව්‍යවස්ථාව සම්පූර්ණය, ආත්මය ප්‍රාණවත්කරන්නේය. ස්වාමීන්ගේ සාක්ෂිය සත්‍යය, නුවණ නැත්තන් ඥානවත්කරන්නේය.

08. ස්වාමීන්ගේ පනත් සාධාරණය, සිත ප්‍රීතිකරවන්නේය. ස්වාමීන්ගේ ආඥාව පවිත්‍රය, ඇස් එළියකරන්නේය.

09. ස්වාමීන් කෙරෙහි භය පිරිසිදුය, සදාකල් පවතින්නේය. ස්වාමීන්ගේ විනිශ්චයෝ සැබෑය, සම්පූර්ණයෙන්ම ධර්මිෂ්ඨය.

# යෙස්සේගේ අංකුරය!

STUMP OF JESSE!



(ප්‍රධාන කර්තෘ දේවගැති ඒන්ජලින් සෙල්වකුමාරි)



කැඳවීමේ ප්‍රතිරාවය පවුලේ සැමදෙනාටම යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් මා සුබ පතමි!

මා යෙසායා අනාගත වක්තෘගේ පොතෙහි 11 වන පරිච්ඡේදය කියවමින් සිටියෙමි. එම පරිච්ඡේදය අප සැම දෙනාම දන්නා පරිදි යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සේවය ගැන සඳහන් කර තිබෙයි. එම පරිච්ඡේදයෙහි පළමු වෙනි පදය මා ඔබට සඳහන් කිරීමට කැමැත්තෙමි.

*''තවද යෙස්සේගේ කඳින් කුරයක් නික්මෙන්නේය. ඔහුගේ මුල් වලින් වූ පැළයක් එල දරන්නේය.''* *(යෙසායා 11:1)*

## අංකුරය

මෙම අංකුරය යන වචනය මගේ අවධානයට ලක්විය. අංකුරයක් යනු කුමක්ද? එනම්; අංකුරයෙන් ජීවයක් හටගන්නවා ඇත. වර්ධනය වීම සඳහා යමක් හටගන්නේ නැතුව එය නිකම්ම කඳින් තිබෙන විට එයට ජීවයක්, අනාගතයක් නැත. නමුත් අංකුරයක් කඳින් හට ගෙන එය විශාල ගසක් බවට පත්වෙයි.

මෙම පදයෙන් අපට පෙනෙන්නේ දාවිත් ගේ රජ පරම්පරාව නිමා වන විට එතැනින් තවත් අංකුරයක් හට ගෙන ස්ථිරව සිටින ආකාරයයි. යෙසායා 11 වන පරිච්ඡේදයෙහි දෙවියන් වහන්සේ දුන් පොරොන්දුව ලෙස සලකන්නේ

3 වෙනි පිටුවට ...




Echo of His Call

Christian YouTube Channel!

An opportunity to pray with Pr. S. Sam Selva Raj!

Message & Prayer in 5 minutes!!

English, Hindi, Tamil & Telugu

Every day – From 2.00 A.M.


Tamil Sunday Service – 8.30 A.M.

* Please Subscribe and Share *

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

## from your dearly beloved brother...

ECHO OF HIS CALL 1969-2019
REACHING NATIONS





### OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
HON. MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Rev. Dr. K.R. Rajasekaran
Rev. Dr. William Robert, Ph.D., DD, D.Lit.

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858
95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

"අපේ දෙවිවූ ස්වාමීන් උසස්කරව්, උන්වහන්සේගේ පාපුටුව වෙත නමස්කාරකරව්." (ගීතාවලිය 99:5)

**ක්‍රිස්තුස්වහන්සේ තුල ප්‍රේමවන්තයෙනි,**

මේ වර්ෂයේ මාස දෙකක් මුළුල්ලේම උන්වහන්සේ ඉතා පුදුමාකාර ලෙස අපට මගපෙන්වා රැගෙන ආ නිසා උන්වහන්සේට සියලු ගෞරවය හා මහිමය පුදකරමි. අපගේ සභාව උදෙසා උන්වහන්සේ කලාවූ සෑම ආශිර්වාද උදෙසාම ස්තුතියි.

දෙමළ භාෂාවෙන් පවත්වනු ලබන නෙහෙමියා බයිබල් විදුහල නිසා විශේෂයෙන් යාච්ඤා කරන්න. සන්තෝෂ පුරම්, චේපක් සහ වෙලාච්චේරි යන ස්ථාන වල අප මේ බයිබල් විදුහල පවත්වාගෙන යමු. තවද හින්දි භාෂාවෙන් පවත්වනු ලබන බයිබල් විදුහල ගැනද යාච්ඤා කරන්න. අද ඉතා කැපවීමෙන් සේවය කරන්නාවූ දේවදාසින්ව සොයා ගැනීම ඉතා අසීරුය. එබැවින් අපගේ බයිබල් විදුහලට කැපවීමෙන් වැඩ කරන්නාවූ දේව දාසයින්ව එවන පිණිස යාච්ඤා කරන්න.

අපගේ භාෂා 16 කින් නිකුත් කරනු ලබන කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව අප නොමිලයේ බෙදාහරිනු ලබයි. අද බොහෝ තරුණ තරුණියන් දේව වචනය කියවීමට අකමැතිය. එම නිසා ඔබ දන්නා හඳුනන අයව සොයා මෙම සගරාව කියවන පිණිස ධෛර්යමත් කරන්න කියා අපි ඔබගෙන් ඉතා ආදරයෙන් ඉල්ලා සිටිමු.

දේව කරුණාවෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ YouTube හරහා සෑම දිනකම හින්දි, ඉංග්‍රීසි, දෙමළ හා තෙලිගු භාෂා වලින් විකාශනය කිරීමට දෙවියන්වහන්සේ අපට උපකාර කර තිබේ. අපගේ ඉරුදින නමස්කාර දේව මෙහෙය YouTube තුළින් සජීවීව විකාශනය වෙයි. ඔබ මෙය නරඹා ආශිර්වාදය ලබාගන්න.

එසේම අප තරුණ, තරුණියන් උදෙසාත් දරුවන් උදෙසාත් කරණ සේවය ගැන විශේෂයෙන් යාච්ඤා කරන්න. මෙම සේවයට ඔබටත් අප හා සමග සම්බන්ධ වීමට පුළුවනි. සෑම දිනකදීම රාත්‍රී 10.00 ට ලොව පුරා සිටින්නාවූ තරුණ තරුණියන් උදෙසාත් දරුවන් උදෙසාත් මතක්කර යාච්ඤා කරන්න.

ලොව මුළුල්ලේම සිටින්නාවූ සෑම පුරුෂයෙක්ටම, සෑම කාන්තාවකටම, සෑම තරුණයෙක්ටම හා සෑම දරුවෙක්ටම දෙවියන්වහන්සේ ප්‍රේම කරණ නිසා අප ඔවුන් ගැන යාච්ඤා කරමු.

මෙම සේවය අප වසර දෙකකට පෙර ආරම්භ කළ අතර අද බොහෝ දෙනෙක් මෙම සේවයට එකතු වී සිටී. ඔබත් මේ සේවයට කැමති නම් අපට දන්වන්න. යාච්ඤා කිරීමට ඔබටද යමක් ඇත්නම් අපට දන්වන්න අප ඒ ගැන යාච්ඤා කරමු. ශාන්ත පාවුළු මෙට්ට්‍රිකියුලේෂන් පාසල, ශුභාරංචි පත්‍රිකා මුද්‍රණාලය, දෙමළ, ඉංග්‍රීසි හා හින්දි භාෂාවෙන් පවත්වාගෙන යනු ලබන තැපැල් මාර්ගික පාඩම් මාලාව උදෙසා යාච්ඤා කරන්න.

ඔබ අප උදෙසා නිතරම යාච්ඤා කරන්න. අපද ඔබ උදෙසා යාච්ඤා කරමු. දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක!

My son, Pastor Alex Samson Sam, entered the Kingdom of the Lord on February 13th, 2025.

යෙසුස කුසතුසවහනසෙ තුල ඔබගෙ සෙවක

*Pr. Alex Samson Sam*

*Pr. S. Sam Selva Raj*

(+91) 98412 71858 / 98410 71858, E.mail : sam@echoofhiscall.org

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) YouTube Ministry Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development

## For Your Kind Attention!

Our 5 minute **Echo of His Call** YouTube messages are being broadcasted from 2.00 A.M. in Tamil, Telugu, English and Hindi (everyday). You can receive the Grace of God by watching the messages.

Moreover, save my mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (personal) in your mobile phones.

- Pr. S. Sam Selva Raj

*1 පිටුවෙන්....*

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නැමැති අත්තිවාරම කරන කොට ගෙන උන්වහන්සේ තුළින් සෑම කුණාටු ප්‍රශ්න වලට මුහුණ දිය හැකි ස්ථිර ජීවිතයක් මෙය විය යුතුයි යන්නයි.

දෙවියන්වහන්සේගේ මුල් සැලැස්ම නම් දාවිත්ට හා ඔහුගේ පරම්පරාවට සදහටම සිංහාසනයක් දෙන බවටයි. එහෙත් ඉතිහාසයේ අපි වෙනස් කතාවක් කියවමු. (2 රාජාවලිය 24 - 25 පරිච්ඡේද) යුදා වංශයේ අන්තිම රජ ශෙදකියා බව අපට පෙනෙයි. මෙම නමෙහි තේරුම 'දෙවියන් වහන්සේගේ දීමනාවයි'. නෙබුකද්නේශර් රජ පැමිණ ඔහුව හිරකරුවන් ලෙස අල්ලා ගන්නා ලදී. එහිදී දාවිත්ගේ රජ පරම්පරාවේ අවසානය සිදු විය. එතනින් පසුව වසර 600ක් පුරාවට ඊශ්‍රායල් හි රජ කෙනෙක් සිටියේ නැත.

මෙවැනි නිහඬ කාලය තුළ දෙවියන් වහන්සේ උන්වහන්සේගේ පොරොන්දුව අමතක කළාද කියා සිතන්නට සිදුවෙයි. නමුත් ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ නියම කළ වේලාව එනතුරු බලා සිටියේය. ජුදාවරුන්ට රජෙක් පැමිණෙනතුරු ඊශ්‍රායල් සෙනඟ බලා සිටියෝය. දෙවියන්වහන්සේගේ කාලය සම්පූර්ණ වූ විට දෙවියන්වහන්සේ ප්‍රකාශ කරනු ලැබූයේ; යේසේගේ කඳින් අන්කුරියක් හට ගන්න බවට උන්වහන්සේ පොරොන්දු විය.

## දළු රිකිළි ලියලයි

**SHOOT!**

මැරුණු කඳෙන් අලුතෙන් ජීවයක් හටගන්නට පුළුවන්ද? එය එසේ වීමට නොහැකිය. නමුත් දෙවියන් වහන්සේට නම් එය පුළුවනි. මන්ද ඔබට බලාපොරොත්තුව අහිමි වූ අවස්ථාවකදී දෙවියන් වහන්සේ අලුත් දෙයක් ආරම්භ කිරීමට පුළුවනි. ඊශ්‍රායල් රාජධානිය අවසන් වූවාය කියා සියලු දෙනාම සිතූ නමුත්, එම බලවත් රාජ්‍යය අසාර්ථක වූ විට දෙවියන් වහන්සේගේ පොරොන්දුව ඉෂ්ට වන පිණිස යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළින් නැවත උන්වහන්සේ ඊශ්‍රායෙල්ට ජීවනයක් දුන්නේය.

ඊශ්‍රායෙල්හි බලාපොරොත්තුව වූයේ ඔවුන්ගේ සතුරන්ව මෙසායා පැමිණ විනාශ කර දමයි කියාය. යේසුස් වහන්සේ ඉතාම යටහත් පහත් ලෙස ගවලෙනක ඉපදුනේ මනුෂ්‍යයන් බලාපොරොත්තු වන ආකාරයෙන් නොව දෙවියන් වහන්සේගේ සැලැස්ම සම්පූර්ණ වන පිණිසය.

යෙස්සේගේ කඳින් අන්කුරයක් හටගන්නේය කියා පවසන්නේ දළු දමනවාය කියා පවසන්නේ; අලුත් ජීවිතයක්, නව බලාපොරොත්තුවක් නැවත ආරම්භ වූවාය කියාය.

අලුතින් පටන් ගන්නා වූ අංකුරයකින්; අලුතෙන් දළු දමා අලුත් දෙයක් ආරම්භ කිරීමට අපිට පුළුවනි. එනම්;

## S→ 1). පොරොන්දුවේ මූලාශ්‍රය.

## 1. SOURCE OF PROMISES!

අපගේ දෙවියන් වහන්සේ පොරොන්දුවේ දෙවියන්වහන්සේයි. උන්වහන්සේ අප හා සමඟ ගිවිසුම් ඇති කරගන්නා අතර කිසි දිනක එම ගිවිසුම කඩ කරන්නේ නැත. උන්වහන්සේගේ පොරොන්දු මත අපගේ අත්තිවාරම තබාගන්නා විට අපි අතිශයෙන්ම ජයගන්නෝ වෙමුව. මන්ද යේසුස්ක්‍රිස්තුස් වහන්සේ තුළ උන්වහන්සේගේ පොරොන්දු සියල්ලම ආමෙන් කියාත් එසේය කියා තිබේ. උන්වහන්සේගේ වචනය උන්වහන්සේ කිසිවිටෙක අමතක කරන්නේ නැත. බලාපොරොත්තු නොවූ අන්දමකින් උන්වහන්සේගේ විශ්වාසවන්ත කමේ පොරොන්දු උන්වහන්සේ ඉෂ්ට කරයි.

උන්වහන්සේ දාවිත්ට වූ පොරොන්දුව ඉෂ්ට කළේය. ***"නුඹේ වංශයද රජකමද නුඹ ඉදිරියෙහි සදාකාලයටම ස්ථිර කරනු ලබන්නේය. නුඹේ සිංහාසනයද සදහටම පිහිටුවනු ලබන්නේය."*** *(2 සාමුවෙල් 7:16)*

කාලයක් දෙවියන් වහන්සේ උන්වහන්සේගේ පොරොන්දු අමතක කළාදෝයි කියා සියලු දෙනාම සිතුවෝය. මන්ද වසර ගණනාවක් පුරාවටම දාවිත්ගේ පරම්පරාවෙන් රජෙක් සිටියේ නැත. නමුත් ඔහුගේ කඳින් දළු දමා අංකුරයක් හට ගත්තේය. දෙවියන් වහන්සේගේ වචනය කිසිවිටෙකත් බලාපොරොත්තු නොවූ විටදී සිදුවන්නට විය.

***"..........මක්නිසාද මා විසින් නුඹට කී දෙය සිදුකරනතුරු නුඹ අත් නොහරින්නෙමී කී සේක."*** *(උත්පත්ති 28:15)*


**Statement about ownership and other particulars about the Newspaper Echo of His Call (Sinhala) - Form IV (See Rule 8)**

| | | |
|---|---|---|
| 1. Place of Publication | : | **New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai - 600 005.** |
| 2. Periodicity | : | **Monthly** |
| 3. Printer, Editor, Owner & Publisher | : | **S. Sam Selva Raj** (Same Address) |
| 4. Nationality | : | **Indian** |

I, **S. Sam Selva Raj** hereby declare that the particulars given above are true to the best of my knowledge and belief.

**March 2025** **S. Sam Selva Raj.**

දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට පොරොන්දු වූයේ ඔබගේ පරම්පරාව අහසේ තාරකා මෙන් බෝවන බවටයි.

උත්පත්ති 22 වන පරිච්ඡේදයෙහි මෙය සඳහන්වේ. කෙසේ නමුත් ආබ්‍රහම්ගේ ඇදහිල්ල දෙවියන් වහන්සේ විසින් සෝදිසියට ලක් කරනු ලැබීය. දෙවියන් වහන්සේ ඔහුගේ එකම පුතු වූ ඊසාක්ව එනම්; පොරොන්දුවේ දරුවාව පූජා කරන්නේ කියා පවසනු ලැබීය. ආබ්‍රහම් ඔහුව පූජාසනයක තබා පිහිය ඔසවන විටදී දෙවියන් වහන්සේ ඔහුගේ පුත්‍රයා වෙනුවට ඔහුට පූජා කිරීමට බැටලුවෙක් එව්වේය. එනම්; උන්වහන්සේ මෙම කතාවෙන් අපිට පෙන්නුම් කරන්නේ, උන්වහන්සේගේ පොරොන්දු උන්වහන්සේ කිසි විටෙක වෙනස් නොකරන බවයි. එනම් මිත්‍රවරුනි, අද උන්වහන්සේ ගේ පොරොන්දුව තදින් අල්ලා ගන්න.


God promised - Abraham descendants would be as numerous as the stars

## 2). බලාපොරොත්තුව නැවත පිහිටුවයි.
## 2. Hope restored!

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පණිවිඩය නම්, සියලු දෙනාටම බලාපොරොත්තුවක් ලබා දීමයි. අපගේ අවස්ථාවන් කොපමණ අමාරු වුවත් බලාපොරොත්තුව නැති වුවත් උන්වහන්සේගේ පොරොන්දුව නම් අපට බලාපොරොත්තුවක් ලබා දීමයි. අද බොහෝ අයගේ බලාපොරොත්තු නැති වී තිබෙන නිසා එනම්; සම්බන්ධතාවයන්, ආර්ථිකය, අනාගතය හා රැකියාව යන මෙවැනි දේවලට බලාපොරොත්තුවක් නැතිව ජීවත්වෙයි. බොහෝ අයට තමා ගැනවත් බලාපොරොත්තුවක් නැත. සුබ පණිවිඩය නම්; යේසුස් ක්‍රිස්තුස් වහන්සේ බලාපොරොත්තුව අහිමි වූ අවස්ථාවකදී ඔබගේ බලාපොරොත්තුව නැවත පිහිටුවාලයි. කිසි දෙයක් හට නොගත්තත් කඳෙන් අංකුරයක් පැමිණ දළු දමා හටගන්නා ආකාරයෙන් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපගේ සියළුම අවස්ථාවන් වෙනස් කරමින් බලාපොරොත්තුවක් ගෙන දෙයි.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපතෙන් අපිට ලැබෙන පණිවිඩය නම් බලාපොරොත්තුවයි. ඔබගේ ජීවිතයේ අලුත් දෙයක් හටගන්නටත් නැවත ඔබගේ ජීවිතයේ අංකුරයක් පැමිණ නැවත එය දළු දමා හට ගන්න බවටත් පොරොන්දුවක් ඇති කරගන්න!

කඳෙන් අංකුරයක් පැමිණ එය දළු දමා ලස්සන ගසක් වී මල් හා කොළ හට ගෙන එය පක්ෂීන් සිටින ස්ථානයක්ද එසේම එම ගසේ සෙවණ යට බොහෝ අයට ආරක්ෂාවද ලැබෙන ලෙස ඔබගේ කැඩුනාවූ බිඳුනා වූ හිස්ව තිබෙන ජීවිතය දෙවියන් වහන්සේ බොහෝ අයට ඔබව ආශිර්වාදයක් කරනු ඇත.


Zarephath was gathering sticks!

එබැවින් සියලුම දේ ගැන විශ්වාසය තබාගෙන බලාපොරොත්තුව තුළ ජීවත් වෙන්න. ආහාර හිඟයක් තිබූ කාලයකදී ශාරෙපත්හි සිටි වැන්දඹු ස්ත්‍රිය ඇගේ අවසාන ආහාර ටික පිස ගැනීමට ඇගේ පුතා සමග සූදානම් වූ අවස්ථාවේ දී එළියා ඈ වෙතට පැමිණ ඇය සෑදීමට ගිය අන්තිම කෑමෙන් පළමු රොටිය සාදා ඔහුට දෙන්න කියා ඇයට පවසනු ලැබීය. ඇය එසේ කරනු ලැබීය. ඉතා ආශ්චර්යමත් ලෙස ස්වාමීන් වහන්සේ ඇගේ මුළු පවුලටම ආහාර හිඟයක් තිබූ එම වසර තුනහමාරක කාලය තුළ ඇයට අවශ්‍ය කෑම ලබා දුන්නේය. ඇගේ තෙල් කුලාව හිඳුනේවත් පිටි ඉවර වුණේවත් නැත.

මෙම කතාවේ (1 රාජාවලිය 17:7-16) මෙම කතාවෙන් අපට උගන්වන පාඩම නම්; දෙවියන් වහන්සේ බලාපොරොත්තුවක් නැති ස්ථානයකදී උන්වහන්සේ අපට බලාපොරොත්තුවක් ඇති කරන්නේ කෙසේද කියා පෙන්වාදීමයි. ඔබගේ ජීවිතයේ කොතරම් ප්‍රශ්නකාරීව බලාපොරොත්තු රහිතව තිබුණත් ප්‍රශ්නයක් නොමැත. යේසුස් වහන්සේව විශ්වාස කරන්න. උන්වහන්සේ නැවත ඔබගේ ජීවිතයට බලාපොරොත්තුව ගෙන දෙයි. දෙවියන්වහන්සේ නැවත ඔබගේ ජීවිතය අලුතෙන් ආරම්භයක් දෙනවා ඇත. එය අන් අයගේ ජීවිතවල කළ ආකාරයෙන්ම දෙවියන් වහන්සේ අපගේ ජීවිතයටත් බලාපොරොත්තුවක් දෙමින් අපව ප්‍රීතිමත් කරයි. වැන්දඹු ස්ත්‍රිය ඇගේ ප්‍රශ්නය දෙවියන් වහන්සේ වෙතට රැගෙන ආ ආකාරයෙන්ම අපත් අපගේ සියලු බර උන්වහන්සේ වෙතට භාර දුන්නහොත් ක්‍රිස්තුස් වහන්සේ අපට සියල්ල ලබා දෙයි. උන්වහන්සේ අපගේ දුක ප්‍රීතියට හරවා නැවත බලාපොරොත්තුව ගෙන දෙයි.

## (3).නැතිවීමෙන් ජය ගැනීම.
## 3. Overcomer of loss!

දෙවියන් වහන්සේ අපව කැඳවා තිබෙන්නේ අපගේ පරාජයන් තුළ ජීවත්වීමට නොව එයින් ජීවිතය ජයගෙන ජීවත්වීමටයි. මේ වසරේදී ඔබට කුමක් සිදු වුවත් ඔබගේ අතීතයේදී සිදු වූ දේ ගැන සිතා ගමන් නොකරන්න.

නමුත් එක් දෙයක් මතක තබාගන්න. කැඩුනා වූ බිඳුනාවූ හා නැතිවුනා වූ සියලු දේ තුළින් දෙවියන් වහන්සේ ඔබට ජයග්‍රහණය ගෙන දෙයි. උන්වහන්සේ අපව නැවත ගොඩනගා උන්වහන්සේ තුළ තිබෙන සම්බන්ධතාවය නැවත අලුත් කිරීමට බලා සිටි. ඔබට කොපමණදේ නැතිවී තිබුණත් ඔබගේ පාපය හා ඔබගේ අතීතය ඔබව නැති කර තිබුණත් උන්වහන්සේට ඔබව නැවතත් ගොඩනැගීමට පුළුවනි.


God restored everything to Job!

යේසුස්වහන්සේගේ යාගය කරනකොට ගෙන උන්වහන්සේ නැවතත් අපව පියාණන් වහන්සේ සමග සම්බන්ධ කර තිබේ. යේසුස්ක්‍රිස්තුස් වහන්සේ කුරුසියේ කුරුසිපත් වූයේ ඔබගේ නැති වූ සෑම දේම ඔබට නැවත ලබාදීමටත්

....Contd. to page 6

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**මාර්:19-** අපගේ යාච්ඤා හවුල්කරුවන්, විශ්වාස හවුල්කරුවන්, ජීවිත කාලය පුරා හවුල්කරුවන්, දායක හවුල්කරුවන් , මහා නියෝගයේ හවුල්කරුවන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට ආශිර්වාද කළ නිසා ස්තුති කරන්න.

**මාර්:20-** බොහෝ ඈත පළාත්වල දෙවියන් වහන්සේගේ සේවයෙහි යෙදී සිටින්නාවූ මිෂනාරිවරුන් සහ ඔවුන්ගේ පවුල් උදෙසා ස්තුති කරන්න.

**මාර්:21 -** ලොව පුරා බයිබල් සහ කිතුනු සාහිත්‍ය පොත්පත් මුද්‍රණයෙහි යෙදී සිටින්නා වූ අයගේ අවශ්‍යතා සපයා දී තිබෙන නිසා ස්තුති කරන්න

**මාර්:22**- අපගේ සේවාවන්වලට පුද්ගලික ලෙස මූල්‍යමය වශයෙන් සහාය දක්වන්නා වූ හවුල්කරුවන් අපිට ලබා දී තිබෙන නිසා ස්තුති කරන්න.

**මාර්:23 -** අපගේ කැදවීමේ ප්‍රතිරාවය සේවයෙහි යෙදී සිටින සහකාර සංස්කරුවන් හා ඔවුන්ගේ පවුල් නිසා ස්තුති කරන්න.

**මාර්:24-** අපගේ සභාවේ ප්‍රධාන දේව ගැති එස් සැම් සෙල්වරාජ් සහ ඔහුගේ පවුලේ අයට දිව්‍යමය රැකවරණය සහ නිරෝගී භාවය ලැබී තිබෙන නිසා ස්තුති කරන්න.

**මාර්:25-** අම්ෂනාරිවරුන්ට මූල්‍යමය වශයෙන් සහ යාඥාවෙන් උපකාර සැපයීමට අපට හැකියාව ලබා දී තිබෙන නිසා ස්තුති කරන්න.

**මාර්:26-** අපගේ ශාන්ත පාවුලුගේ මෙට්‍රිකියුලේෂන් පාසලේ සියලු ක්‍රියාකාරකම් නිසාත් නෙහෙමියා බයිබල් විද්‍යාලය සහ තැපැල් මාර්ගික දේව ධර්ම පාඨමාලාව නිසා ස්තුති කරන්න.

**මාර්:27-** මිෂනාරිවරුන් විසින් යහපත් ක්‍රිස්තියානි ධර්මයන් මත ආරම්භ කරන ලද පාසල් තුළින් ලෝකයට ආශිර්වාද ලැබී තිබෙන නිසා ස්තුති කරන්න

**මාර්:28-** 1969 වන වර්ෂයේ සිට සඟරා සේවය සඳහා අප කළ කැපවීම ට දෙවියන් වහන්සේ නොමදව ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න

**මාර්:29-** කැඳවීමේ ප්‍රතිරාවේ සේවයේ You Tube නාලිකාව හරහා අපට නව දායකයින් ලබාදී ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**මාර්:30-** අපගේ තරුණ හා ළමා සුරැකුම් සේවයේ ගෝලීය දර්ශනයට ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**මාර්:31-** අපගේ රාජ්‍ය සම්බන්ධීකාරකවරුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:01-** සියලුම රටවල් කෙරෙහි දිව්‍යමය ආරක්ෂාව, විශේෂයෙන් අවුල් වියවුල් සහ යුද බිය මධ්‍යයේ සාමය සහ ස්ථාවරත්වය උදෙසා ස්තුති කරන්න.

**අප්‍රේ:02**- දේශපාලන හා ආගමික විරුද්ධවාදිකම් මධ්‍යයේ අපගේ කිතුණු සේවාවන් දියුණු වීමට උපකාර කර තිබෙන නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:03-** අපගේ ප්‍රධාන දේවගැති තුමාගේ කැපවීම නිසා සුභාරංචි සේවය විවිධ සේවාවන් හරහා ප්‍රචාරය කිරීමට හැකි වී තිබෙන නිසා ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**අප්‍රේ:04:** අපගේ ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසලේ 10 වසරේ සිටින සිසුන් මෙවර රජයේ විභාගයට පෙනී සිටින නිසා යාච්ඤා කරන්න

**අප්‍රේ:05-** 2025 -2026 වන අධ්‍යයන වර්ෂය සඳහා අපගේ නිවාසික සහ සන්ධ්‍යා කාලයේ පවත්වන නෙහෙමියා බයිබල් විද්‍යාලයට සුදුසුකම් ඇති සිසුන් ඇතුළත් කර ගැනීම පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:06-** අපගේ ප්‍රධාන දේවගැති එස්. සැම් සෙල්වරාජ් තුමාගේ විවිධ සේවාවන් සඳහා තිබෙන නව දර්ශන වලට ආශිර්වාද ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:07-** ළමුන් සහ තරුණ තරුණියන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමෙන් ආරක්ෂා කරගන්නා පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:08-** ලොව පුරා වැඩි වෙන නරක පුරුදුවලින් ළමුන් සහ තරුණ තරුණියන් ආරක්ෂාව වන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:09-** 2025 - 2026 අධ්‍යයන වර්ෂය සඳහා අපගේ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලට නවක සිසුළු සිසුන් ඇතුළත් කරගන්නා පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:10-** ලොව පුරා ව්‍යාප්තව තිබෙන ළමා ජාවාරම් තුරන් වෙන පිණිස

**අප්‍රේ:11-**ලෝකයේ පුරා ව්‍යාප්තව තිබෙන සභාවන්වල නව පිබිදීමක් ඇතිවෙන පිණිස යාච්ඤා කරන්න.

**මාර්:12-** සියලුම ජාතීන්ට අයත් ජනාධිපතිවරු, අගමැතිවරු, මහ ඇමතිවරු සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් උදෙසා යාච්ඤා කරන්න.

**අප්‍රේ:13-** යේසුස් ක්‍රිස්තුස්වහන්සේව තම පුද්ගලික ගැලවුම්කරුවාණන් ලෙස පිළිගැනීමට ලෝකයේ සිටින්නා වූ සියලුම තරුණ තරුණයින්ට හා දරුවන්ට උපකාර කරන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:14-**- ලොව පුරා සිටින සියලුම මිනිසුන්ගේ අවශ්‍යතා සම්පූර්ණ වෙන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:15 -** සෑම අංශයකින්ම සහ සෑම සැලසුම්කරණයක් තුළින්ම සියලුම රටවල් තුළ සමගිය ප්‍රගතිය සහ සාමය අත්විඳීමට හැකි වන පිණිස යාච්ඤා කරන්න.


**අප්‍රේ:16-**- අපගේ සේවාවන් වලට යාච්ඤාවෙන් හා මූල්‍යමය සහයෝගයෙන් ආශිර්වාදයක් සහ ශක්තියක් වී අපව ආරක්ෂා කරන්නාවූ ආධාරකරුවන්, සුභ පතන්නන් සහ මිතුරන්ට ආශිර්වාද කර කරන පිණිස යාච්ඤා කරන්න.

**අප්‍රේ:17-**- අපගේ ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවන්වල මහ සිකුරාදා සහ පාස්කු ඉරුදින පවත්වනු ලබන දේව මෙහෙයන් උදෙසා යාච්ඤා කරන්න.

**අප්‍රේ:18-**- විපතට පත්වූවන්ට සහන සලසමින් ගෝලීය ආර්ථික අවපාතය අවසන් වන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

ක්‍රිස්තුස්වහන්සේගේ පොරොන්දුවෙන් ඔබට ජයග්‍රහණය දෙන පිණිසත්ය. මැරුණා වූ දේට ප්‍රාණය දීමට ස්වාමීන්වහන්සේට පුළුවන්නම් ඔබට උන්වහන්සේ කොපමණ දේ කරන්න පුළුවන්ද කියා සිතා බලන්න. යෝබ්ගේ ජීවිත කතාව දෙස බලන්න. යෝබ් 42 වන පරිච්ඡේදය තුළ අපට පෙනෙන්නේ යෝබ්යේ සෑම දේම නැති වුවත් එනම් ඔහුගේ දරුවන් වස්තුව ශාරීරික සුවය සියල්ලම අහිමි වූවත් යෝබ් ඉතාමත්ම විශ්වාසවන්තව සිටියේය. අවසානයේදී දෙවියන් වහන්සේ සෑම දේ තුළින්ම ඔහුට දෙගුණයක් ලබා දුන්නේය. යෝබ්ගේ ජීවිත කතාවෙන් අපට මතක් කර දෙන්නේ අපට නැතිවූ දේ සියල්ලම දීමට දෙවියන් වහන්සේට පුළුවන් කියාය.



David recovered everything

ඒ ආකාරයෙන්ම 1 සාමුවෙල් 30වන පරිච්ඡේදයෙහි දාවිත් ගේ සියලුම දේ අම්ලෙක් වරු කොල්ලකෑවේය කියා සඳහන් වෙයි. එම අවස්ථාවේදී දාවිත් දෙවියන් වහන්සේ තුළ තමාගේ ශක්තිය ලබා ගත්තේය. එම බලයෙන් ඔහු නැතිවූ සෑම දේම නැවත ලබාගෙන ජයග්‍රහණය කළේය. ඔබගේ ජීවිතයේත් ඔබට අහිමි වූ සෑම දේ තුළින්ම ස්වාමීන් වහන්සේට ජය ලබාදීමට පුළුවන.

## 4). අලුත් ආශිර්වාදය ඔබට විවෘත කරයි.

## 4. OPENER OF NEW BEGINNINGS!



දේව වචනයෙහි සඳහන් කරන්නේ දෙවියන් වහන්සේ අප සෑම දෙනා ගැනම සැලැස්මක් තබා තිබෙනවාය කියාය. එනම් උන්වහන්සේගේ සැලැස්ම අපට යහපත් අනාගතයක් හා ඉතා හොඳ බලාපොරොත්තුවක් දෙන බවයි. ස්වාමීන් වහන්සේගේ අල්ලෙහි අපගේ නම කොටා තිබේ. නමුත් සමහර අවස්ථාවන්වලදී ජීවිතයේ අපි බලාපොරොත්තු නොවූ දේ සිදුවෙයි. එවිට සෑම දේම අපට නැති වෙයි කියා සිතමු.

නමුත් යේසුස්වහන්සේ සෑම විටම අපට දෙවැනි අවස්ථාවක් ලබාදෙයි. අප වැරදි කිරීමට පුළුවන. නමුත් උන්වහන්සේ එය යහපතට හරවයි. ***''තවද දෙවියන්වහන්සේට ප්‍රේම කරන්නන්ට එනම් උන්වහන්සේගේ අභිප්‍රායත් ලෙස කැඳවනු ලැබූවන්ට සියලු දේම යහපත පිණිස එකට ක්‍රියාකරන බව අපි දනිමුව." (රෝම 8:28)***

ස්වාමීන්වහන්සේ අපට අලුත් දොරවල් සහ අලුත් දෙයක් විවෘත කරන්නා වූ දෙවියන් වහන්සේයි. ඔබ මේ දේ කියවන විටදීත් දෙවියන් වහන්සේ ඔබගේ ජීවිතයේ ඔබට නැගිටින පිණිස අලුත් දෙයක් කරයි කියා මා බලාපොරොත්තු වෙමි. යේසුස් වහන්සේ මෙලොවට පැමිණෙන්නේ අපගේ ජීවිතය අර්ථවත් කිරීමටත් අපට අමරණීය ජීවිතයක් දෙන පිණිසත්ය. එබැවින් ඔබගේ ජීවිතය උන්වහන්සේට කැප කරමින් යාච්ඤා කරන්න. උන්වහන්සේ ඔබගේ ජීවිතයෙහි සෑම දේම අලුත් කරයි.

ඔබගේ ජීවිතයෙහි සියලු දේ නැති වූ කල්හි හරියට ම ගසේ කඳෙන් අංකුරයක් හට ගන්නවාක් මෙන් ඔබගේ ජීවිතයේත් අලුත් දෙයක් හටගනී. සෑම දේම මලානික වීමට පුළුවන. නමුත් දෙවියන් වහන්සේගේ බලයෙන් ඔබට ජීවනය දීමට පුළුවනි. එසකියෙල් 37 වන පරිච්ඡේදයෙහි දෙවියන් වහන්සේ පවසන්නේ වියළි ඇටකටු වලට කතා කරන්නේ කියාය. එවිට එය ජීවමාන විය. ඔබගේ ජීවිතයේ වියලි තැන් වලට උන්වහන්සේගේ පොරොන්දුව කතා කරන්න.



Ezekiel saw a vision of a valley filled with dry bones

ජීවනය ලබන පිණිස එසකියෙල් වියලි ඇටකටු වලින් පිරුණා වූ මිටියාවතක් දුටුවේය. නමුත් දෙවියන් වහන්සේ එම ඇටකටු වලට අනාවැකි කීමට කියා ඔහුට පැවසීය. ඔහු දේව වචනය ඒවාට පැවසූ විට එම ඇටකටු සියල්ල එකතු වී ඒවාට මස් ඇවිත් ඔවුන්ට ජීවනය ලැබුණේය. ඔහු විශාල සේනාවක් විය. මෙයින් උන්වහන්සේ අපට උගන්වන්නේ අපගේ ජීවිතයේ නව ආරම්භයක් දෙවියන් වහන්සේට දීමට පුළුවනි කියාය.

....Contd. to page 9

# MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press - Publications
11. St. Paul's Matriculation School - Village English High School
12. Sunday Schools : 10.30 a.m. & 4.00 p.m. Sunday
13. **Early Morning Service : 5.30 a.m. Sunday**
14. **Tamil Service : 8.30 a.m. Sunday**
15. **Youth Service : 11.00 a.m. Sunday**
16. **Fellowship Lunch : 12.30 p.m. Sunday**
17. **Travel to Mission Centres : 1.30 p.m. Sunday**
18. **Children Ministry : 3.00 p.m. Sunday**
19. **Hindi Service : 4.00 p.m. Sunday**
20. **Telugu Service : 5.00 p.m. Sunday**
21. **Telugu, Hindi & Telugu Service : 6.00 p.m. Sunday**
22. Women's Prayer : 5.30 p.m. Wednesday
23. Men's Prayer : 7.00 p.m. Friday
24. Discipleship Meeting : 6.00 p.m. Saturday
25. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
26. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
27. Ministers' Meeting : 6.00 p.m. First Saturday
28. Parents' Prayer : 4.00 p.m. First Sunday
29. Night Prayer : 9.30 p.m. Third Friday
30. Fasting Prayer : 9:30 a.m. Second Saturday
31. Holy Communion : Second Sunday Services
32. Youth / Kid Prayer : 10.00 p.m. daily
33. Staff Devotion : 9.00 a.m. daily
34. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

Pray for

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE
REACHING NATIONS

**NEHEMIAH BIBLE COLLEGES,**

Chepauk & Santhoshapuram, Velachery Chennai.

Qualification : 10th Standard & above

**Rush for admission!** Medium : Tamil (Part Time)

**Diploma in Theology** Hindi (Residential) (Sponsorship Available)

Recognised by International Christian Leaders & Senior Pastors for the past 55 years

**Contact : The Chairman, Nehemiah Bible College.**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.

Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858

E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

## ‘‘...කියවන්නා තේරුම් ගනීවා....’’ *(මතෙව් 24:15)*

‘‘... ස්වාමීන් වහන්සේ කෙරෙහි විශ්වාස කරන්නා ද වාසනාවන්තයෙක්ය’’ (හිතෝපදේශ 16:20)

මගේ සේවයේ මුල් කාලයේදී මා නිතරම සිතූ දෙයක් නම්, විදේශ රටවල සිටින දේව සේවකයින් ජීවත් වන්නේ කෙසේද? කියාය. තවද ඔවුන්ගේ ආත්මික ජීවිතයේ වර්ධනයත් ඔවුන්ගේ සේවය එම දේශයන් තුළ පවත්වාගෙන යන්නේ කොයි ආකාරයෙන්ද කියාත් මා දුටු විටදී නිතරම මවිතයට පත්විය. ඒ කාලයේදී මට බොහෝ ආර්ථික ප්‍රශ්න තිබුණි. ආත්මික දීමනා ද මා තුළින් පිබිදීමක් ඇතුව ක්‍රියාත්මක වූයේද නැත. අන් අයගේ උදව් උපකාරයන්ද මා හට තිබුණේ නැත.

අවස්ථාවන් මේ ආකාරයෙන් තිබෙන විටදී මාම පුදුමයට පත්වන ආකාරයෙන් අගෝස්තු මාසයේදී මා මැලේසියාවට යනවාය කියා මගේ දින පොතෙහි ලියා තිබුනි. මා මෙසේ ලියා තිබූ දෙයද මා හට අමතක වී තිබුණි. මෙසේ මාස තුනක කාලයක්ම ඒ ගැන මා සිතුවේද නැත. දිනක් මා මගේ දිනපොත පෙරළා බලන විටදී මා මැලේසියාවට යනවා කියා ලියා තිබූ සටහන දුටුවෙමි. එවිට අගෝස්තු මාසය ඉතා ළන්ව තිබුණේය. මා එය දෙවියන්වහන්සේගේ හස්තෙහි තබා ඒ කාරණාය උදෙසා යාච්ඤා කිරීමට පටන් ගත්තෙමි. උන්වහන්සේගේ වචනය මා විශ්වාස කෙළෙමි.

***‘‘නුඹලා කිසිවක් ගැන කණගාටු නොසිතා සියල්ලෙහිදී ස්තුති දීම සමග යාඥාවෙන්ද කන්නලවෙන්ද නුඹලාගේ ඉල්ලීම් දෙවියන් වහන්සේට දන්වාපල්ලා.” (පිලිප්පි 4:6)***

මෙසේ සති ගණන් ගෙවී ගියේය. කිසි දෙයක් සිදුවූයේ නැත. විදේශ රටකට යාමට අවශ්‍ය දේවල් මා හට නොමැති නමුත් මගේ ඇදහිල්ල තිබුණේ දෙවියන්වහන්සේ මාව ගෙනියන බවටයි. මේ කාලයේදී නිතරම මැලේසියාවේ සේවයට යන්නාවූ සහෝදරයෙක් සිටියේය. මා මැලේසියාවට යාමට තිබූ ආශාව ඔහුට පැවසුවෙමි. ඔහු මට පවසනු ලැබුවේ; ඔහුගේ නිවසට පැමිණෙන්න කියාත් ඒ සම්බන්ධව වැඩි විස්තර මා ඔබට පවසන්නම් කියාත් ඔහු මාව ධෛර්යමත් කළේය.

පසු දින උදෑසන මා ඔහුගේ නිවසට ගියෙමි. අවාසනාවන්ත ලෙස එදින ඔහු නිවසෙහි සිටියේ නැත. මෙලෙස මාසයක් පමණ ගතවිය. මා ඔහුව බැලීමට ගිය සෑම අවස්ථාවකදීම මගේ කාලය හා මුදල් අපතේ ගියේය. පසුව මට දැනගන්නට හැකි වූයේ ඔහු මට උදව් කිරීමට අකමැති බවයි. අවසානයේදී ඔහු; ‘‘ඔබට මැලේසියාවට යාමට බැහැ, මං වාගේ දක්ෂ අයට පමණයි එහි සේවයට යාමට පුළුවන්. ඔබව එහි පිළිගැනීමට කිසිවෙක්ද නැත. එබැවින් නැවත මෙහි එන්න එපා.” කියා පැවසුවේ ඔහු මාව අධෛර්යට පත් කළමුත් මා මගේ බලාපොරොත්තුව නැති කරගත්තේ නැත. මේ ගැන මා නොකඩවාම යාච්ඥා කරමින් දෙවියන් වහන්සේ වෙනත් මාර්ගයක් මා උදෙසා අරිය කියා බලාපොරොත්තු වූවෙමි.

සති දෙකකට පසුව මා මගේ කාර්යාලයට ගොස් එය අස් කරන අවස්ථාවේදී මැලේසියාවේ සිට මගේ නමට එවා තිබූ ලිපියක් හමුවිය. එම ලිපිය දේව ගැති දේව රාජ්ලු විසින් මගේ නමට ඒවා තිබුණි. එහි මේ ආකාරයෙන් සඳහන් කර තිබුණි. එනම්;

‘‘ක්‍රිස්තුස්වහන්සේ තුළ ප්‍රිය සහෝදර සෑම් සෙල්වරාජ්,
මා පොත්පත් කියවීමට ඉතා ආශා කෙනෙකි.
අද මගේ පොත් රාක්කය දෙස බලන විට කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවේ පරණ පිටපතක් මා දැක එය කියවෙමි. දෙවියන් වහන්සේ ඒ තුළින් මට කතා කළේය. කරුණාකර ඔබ අලුතෙන් නිකුත් කරන්නා වූ සඟරාවන් මට එවන්න. එයට වැයවන තැපැල් ගාස්තු මා ඔබට එවන්නම්.

එසේම ඔබව පුද්ගලිකව මුණ ගැසීමට මා කැමතියි. ඒ නිසා ඔබ මැලේසියාවට එනවනම් ඔබගේ සියලු ගමන් ගාස්තු, කෑම බීම, නැවතුම් පහසුකම් හැම දෙයක්ම මා ඔබ වෙනුවෙන් ගෙවන්නම්, කරුණාකර ඔබට පුළුවන් දවසක මැලේසියාවට එන්න. ඒ වගේම මා ඔබගේ සේවයටත් මැලේසියාව, සිංගප්පූරුව හා ඉන්දුනීසියාවට යාමට අවශ්‍ය පහසුකම් ද සපයා දෙන්නම්, ඔබ වගේ සේවකයින් අපේ රටට අවශ්‍යයි. කරුණාකර ඒ සඳහා පිළිතුරක් මා වෙත එවන්න.”
මීට ප්‍රිය දේවගැති,
දේව රාජ්ලු

මෙසේ දෙවියන් වහන්සේගේ විශ්වාසවන්තකම දුටු මා ඉතා ප්‍රීතිමත් වූවෙමි. මගේ දිනපොතෙහි ලියා තිබූ පරිදි 1989 වන වර්ෂයේ අගෝස්තු මාසයේදී පාස්ටර් දේව රාජ්ලුගේ ආරාධනය පරිදි මා මැලේසියාවට ගොස් සිංගප්පූරුවටද පසුව ඉං ඉන්දුනීසියාවටද ගියෙමි. මගේ රැස්වීම් මාලාවලදී සිය ගණන් සෙනඟ යේසුස් වහන්සේව පිළිගත්තෝය. දෙවියන් වහන්සේ මගේ සේවයට පමණක් නොව අලුත් මිත්‍රයින්ද මට දී ආශිර්වාද කළේය. එම මිත්‍රත්වය මේ රටවල් හා සමඟ තවමත් තිබේ. එදා සිට දෙවියන් වහන්සේ මගේ සේවාවන්වලට බලවත් ලෙස ආශිර්වාද කිරීමට පටන් ගත්තේය. අප්‍රිකාව, ඇමරිකාව, එංගලන්තය, ස්කොට්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, සුවිසර්ලන්තය, කැනඩාව, ඕස්ට්‍රේලියාව හා ශ්‍රී ලංකාව වැනි රටවලට ගොස් සේවය කිරීමටත් බොහෝ අයට ආශිර්වාදයක් වීමටත් දෙවියන් වහන්සේ මාව පාවිච්චි කළේය. අදටත් බොහෝ රටවල්වලට මට එන්නය කියා පැවසුවත් සේවයේදී මා හට තිබෙන කාර්ය බහුලත්වය නිසා දැන් එම රටවල් වලට යාමට නොහැකි වී තිබේ.

ප්‍රිය සහෝදරයා සහෝදරිය අප සේවය කරන්නා වූ ස්වාමීන් වහන්සේ බලසම්පන්නයි. උන්වහන්සේගේ මාර්ගය සත්‍ය හා ජීවනයයි. උන්වහන්සේව විශ්වාස කරන්න. ඔබගේ ජීවිතය උන්වහන්සේට භාර කරන්න. උන්වහන්සේට සේවය කරන්න. ඇදහිල්ලෙන් ඉදිරියට යන්න. උන්වහන්සේ ඔබට මග පෙන්වයි.

***‘‘එම්බා පොළොව පර්වතය දිය පොකුණක්ද ගිනිගල දිය උල්පතක්ද කළා වූ,” (ගීතාවලිය 114:7)***

************

6 පිටුවෙන්....

ස්වාමීන් වහන්සේ පවසන්නේ තවම අපගේ ජීවිතයේ සිදු නොවූ දෙයක් සිදුවෙන බවට පොරොත්තුව තබාගන්න කියාය. රෝම 4:17 හි මෙසේ පවසයි *“......... ආබ්‍රහම් තමා විශ්වාස කළා වූ මළවුන් ජීවත් කරන්නාවූ නැති දේ ඇති දේ මෙන් සඳහන් කරන්නාවූ දෙවියන් වහන්සේ ඉදිරියෙහි අප සියල්ලන්ගේ පියානෝය.”*

*“.....ඉතින් අප තුළ ක්‍රියා කරන්නා වූ බලයේ හැටියට අපි ඉල්ලන නොහොත් සිතන හැමදේට වඩා හිතා අධික ලෙස කරන්ට බලය ඇත්තා වූ......” (එපීස 3:20)*

ඔබගේ බලාපොරොත්තුව නැති කර නොගන්න. ඔබගේ ජීවිතයට අලුත් ආරම්භයක් බලාපොරොත්තු වන්න. ඔබ විශ්වාස කළහොත් දෙවියන් වහන්සේගේ මහිමය දකිනු ඇත. උන්වහන්සේව විශ්වාස කරන්න. උන්වහන්සේ අසීමිත දෙවියන් වහන්සේයි. අපගේ ජීවිතයට පැමිණෙන ඕනෑම අභියෝගයන් වලදී සෑම දේම වෙනස්කර අපට සුභ අනාගතයක් දීමට ස්වාමීන්වහන්සේට පුළුවනි.

## T→ (5). සැබෑ වූ මිදිවැල

## 5. THE TRUE VINE!

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සැබෑ වූ මිදිවැලයි. උන්වහන්සේ අපගේ ජීවිතයේ සියලු සපලත්වය ලබාදෙයි.



Those who abide in Him bear much fruit, glorifying the Father

උන්වහන්සේ තුළ ඵල දැරීමට නම්, උන්වහන්සේ තුළ පවතින්නේ කියා උන්වහන්සේ පවසයි. උන්වහන්සේ මෙලොවට පැමිණුනේ අප උන්වහන්සේගේ දරුවන් වන පිණිසත් ඵල දනන පිණිසත් උන්වහන්සේගේ රාජ්‍ය උදෙසා ජීවත් වන පිණිසත්ය. “ ........ මක්නිසාද මාගෙන් වෙන්ව කිසිවක් කරන්නට නුඹලාට බැරිය.” (යොහාන් 15:5)..

මෙහිදී උන්වහන්සේ අතු ලෙස සඳහන් කරන්නේ ඵල දැරීමෙන් වර්ධනය වීමත් සම්පූර්ණ වීමත්ය. ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයන් හැටියට ස්වර්ගයේ පියාණන් වහන්සේව මහිමයට පත්වන පිණිස අප සියලු දෙනාම ඵල දැරිය යුතුයි. යේසුස් වහන්සේ පවසනු ලැබුවේ;


## Echo of His Call Postal Courses for candidates in India only

**Pray for BIBLECOR**

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

The Chairman, Nehemiah Bible College, Echo of His Call, **Post Box 2957**, CHEPAUK, CHENNAI - 600 005.
Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in

**Pray for IMMEDIATE REQUIREMENT**

**ECHO OF HIS CALL is expanding at a fast pace. We need mission minded, dedicated and faithful men and women candidates for the following positions:**

- Full time Assistant Pastors for our Main Church
- Full time Assistant Pastors for our Branch Churches in Chennai
- Full time security personnel
- DTP Operators and Typists
- Candidates with proficiency in speaking and writing English and other languages
- Managers and Co-ordinateors interested in School & Office Administration
- Full time Bible College Lecturers
- Volunteers who can promote our ministry in cities & villages
- Hon. Co-ordinators to serve in Editorial Board of **Echo of His Call**
- Full time Drivers
- Principal and Teachers for Matriculation School
- Full time female cooks
- Full time housekeeping employees

**Salary based on qualification and experience.**

Please Contact **ECHO OF HIS CALL** office
**Apply at Whatsapp No : 98412 71858**
**Email : sam@echoofhiscall.org**

RNI NO. TN/SIH/2006/17846

උන්වහන්සේ සැබෑ මිදිවලයි. අපි උන්වහන්සේගේ අතුය. උන්වහන්සේ තුළ පැවතී සිටින්නේ කියාය. මන්ද උන්වහන්සේ නොමැතිව අපට කිසි දෙයක් කළ නොහැකිය. උන්වහන්සේ තුළ පැවතී සිටින තැනැත්තා බොහෝ ඵලදරයි. (යොහාන් 15)

යේසුස්වහන්සේ නැමති සැබෑ මිදිවැලට අප සම්බන්ධ වී උන්වහන්සේ සමග එකතුවී සිටිනවා නම් අප දිනපතා වර්ධනය වී ඵලදරමු. ඔබ යෙසායා 11:1 පදය මෙනෙහි කරන කල දෙවියන් වහන්සේ ඔබ තුළද ඔබගේ ජීවිතය තුළද අලුත් අංකුරයක් හට ගැනීමට සලස්වයි. ඔබගේ පවුල තුලත් ඔබගේ සේවය තුළත් ඔබ රැකියාව කරන්නාවූ ස්ථානය තුළත් කුඩා අංකුරයක් හටගෙන එය දළු දමන්නට පුළුවනි. නමුත් එය දිනකදී විශාල ගසක් වන බව විශ්වාස කරන්න.

මෙම වසරේදී අලුත් ආරම්භයක් ඔබගේ ජීවිතේ සිදුවන බවට මා යාච්ඤා කරමි. ඔබ ස්වාමීන්වහන්සේව විශ්වාස කරමින් බලාපොරොත්තුව තබාගන්න. ඔබගේ සෑම නැතිවූ දෙයක්ම ස්වාමීන්වහන්සේ ඔබට ලබාදී ඔබව ජයග්‍රහණය කරා ගෙන යනවා ඇත. උන්වහන්සේ ඔබට අලුත් ආත්මික දොරවල් විවෘත කරන සේක. මෙම වසර ඔබගේ ජීවිතයෙහි අලුත් දෙයක් ආරම්භ වී ඵල දරන ආකාරයෙන්ම ඔබගේ ජීවිතයෙහි සෑම අංශයකින්ම ආශිර්වාද ලබන්නේ කියා මා යාඥා කරමි. උන්වහන්සේව විශ්වාස කරන්න ඔබට බොහෝ ඵලදැරීමට පුළුවනි. ඔබගේ ජීවිතය කරන කොටගෙන ස්වාමීන් වහන්සේව මහිමයට පත්කරන්න.

************

## Echo of His Call

**YouTube**

Please subscribe

Kindly view and subscribe our **Echo of His Call YouTube** Channel when you get time. Thanks.

**- Editor**

# ECHO OF HIS CALL

**Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.**

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps **(Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.)** to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
on 3rd **MARCH 2025.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**